හේවාවසන්, එච්.එච්.එන්.එස්.
ඉතිහාස අධ්‍යයන අංශය

*Paper: Diversity*

# පැරණි ලංකාවේ සත්ත්ව පාලනය පිළිබඳව තොරතුරු විමර්ශනය කිරීමකි

සතුන් ගෘහාශ්‍රිත කිරීම වූ කලී මානව ඉතිහාසයේ මිනිසා ලැබූ විශිෂ්ට ජයග්‍රහණයක් වන්නේ ය. ප්‍රථමයෙන් ම හීලෑ කරගත් සත්ත්වයා වූයේ බල්ලා ය. අනතුරුව එළු, බැටළු, ගව, හස්ති, අශ්ව ආදී වූ විවිධ සතුන් හීලෑ කරගැනීමට මිනිසා සමත් විය. මෙකී සත්තු අතීතයේ පටන් ම මානව සමාජයේ ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික ආදී වූ විවිධ අංශවලට සම්බන්ධ වී සිටියහ. ප්‍රවාහන කාර්යයේදී ද ආහාර අවශ්‍යතාවලදී ද සංස්කෘතික කටයුතුවලදී ද මෙම සතුන් අත්‍යාවශ්‍ය වූ අතර ශිෂ්ටාචාරයේ වර්ධනයට ඔවුන් ඉටුකළේ මාහැඟි දායකත්වයකි.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය උපයෝගී කර ගනිමින් අතීත ජන සමාජය තුළ සත්ත්ව පාලනය පවත්වාගෙන ගිය අයුරු විමර්ශනය කිරීමයි.

කෘෂි ආර්ථිකයක් මත පදනම් වූ ජීවන රටාවක් හිමි ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය යනු ඉතා වැදගත් ආර්ථික කටයුත්තක් විය. කෘෂිකාර්මික රටවලවදී සෙසු සතුන්ට වඩා ප්‍රමුඛත්වයක් ගවයාට හිමි වූයේ ගොවිතැන්දී ලබා දුන් දායකත්වය හේතුවෙනි. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් ම වියළි කලාපයේ කැලෑවල මී ගවයන් හා ගවයන් දක්නට සිටි බව පුරාවිද්‍යාත්මක කැණීම්වලදී සොයා ගෙන තිබේ.

එසේ ම ක්‍රි.පූ. 6 වන සියවස වන විට කිරි ලබා ගැනීම හා කෘෂිකාර්මික කටයුතුවල යෙදවීම සඳහා ගවයින් ඇති කරනු ලැබීය. *මහාවංසයට* අනුව ක්‍රි.පූ. 4 වන සියවයේදී පණ්ඩුකාභය කුමරු සඟවා තැබුවේ "දොරමඬලාව" නම් ගොපලු ගමක ය. එමෙන් ම ක්‍රි.පූ. 3 සියවසෙහි සිටි ගොපලු කුලයන් පිළිබඳව *මහාවංසයේ* සඳහන් වේ. ගවයින් යොදා සිදුකළ සී සෑමේ උත්සව පිළිබඳව *රසවාහිනියෙහි හා සද්ධර්මාලංකාරයෙහි* සඳහන් වේ. එසේ ම එළදෙනුන්ගෙන් ලබාගත් කිරිවලින් විවිධ ආහාර සැකසූ බවත් භික්ෂූන් වහන්සේලාට ගිතෙල්, වෙඬරු මෙන් ම දී කිරි ද දානය වශයෙන් පිළිගැන්වූ බවත් මූලාශ්‍රයවල සඳහන් වේ. ප්‍රවාහන කටයුතුවලදී ද ගවයන් හා මී ගවයන්ගේ සේවය අත්‍යාවශ්‍ය වූ බව මූලාශ්‍රය සාධක ඇසුරින් පැහැදිලි වේ. බොහෝ විහාරාරාම සතුව මීවුන්, ගොන් හා ගැල් පැවති බවට සෙල්ලිපිවල සඳහන් වේ.

ගවයාට අමතරව කුකුළන්, එළුවන්, ඌරන් ආදී වූ විවිධ සතුන් ඇතිකරනු ලැබූ අතර එම සතුන්ගේ මාංස ආහාරයට ගැනීමේ සිරිතක් ද විය. එකල ආහාරයට ගත් මස් වර්ග අතර මුව මස්, ඌරු මස්, මොණර මස් හා වටු මස් ආදිය ද විය. *සද්ධර්මාලංකාරයේ* සඳහන් වන්නේ භික්ෂූන් වහන්සේලාට ඌරු මස් මෙන් ම මොණර මස් ද දානය වශයෙන් පූජාකළ බවකි. මූලාශ්‍රයවලට අනුව ගවමස් අනුභව කළ පුද්ගලයන් චණ්ඩාල කුලයෙහි ලා සලකනු ලැබීය.